UNITED NATIONS
SRI LANKA

TOGETHER FOR SUSTAINABLE DEVELOPMENT

# මාධ්‍ය නිවේදනය

### ක්ෂණික සම්ප්‍රේෂණය සඳහා

## හනා සිංගර් ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිත සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නිත්‍ය නියෝජිත ලෙස වැඩ කටයුතු ඇරඹුවාය

**කොළඹ, සැප්තැම්බර් 6, 2018** - හනා සිංගර් මෙනවිය එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිත සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නිත්‍ය නියෝජිත ලෙස, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට බදාදා ඔහුගේ නිල නිවසේදී සිය අක්ත පත්‍ර භාරදුන්නාය. සිංගර් මෙනවිය මෙම සතියේදී විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මහතාද හමුවූවාය.

රටේ ජ්‍යෙෂ්ඨතම එක්සත් ජාතීන්ගේ නිළධාරිනිය ලෙස සිංගර් මෙනවිය එක්සත් ජාතීන්ගේ මහා ලේකම් තුමා නියෝජනය කරමින් 22 ක් වූ නේවාසික සහ අනේවාසික එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන සහිත මෙරට එක්සත් ජාතීන්ගේ කණ්ඩායමට නායකත්වය ලබා දෙන්නීය.

මෙම පත්වීමට පෙර ඇය ලොව විවිධ ප්‍රදේශවල යුනිසෙෆ් (UNICEF) හි ඉහල කළමණාකරණ තණතුරු රාශියක් දැරුවාය. ජිනීවාහි යුනිසෙෆ් කලාපීය අධ්‍යක්ෂ, මෙන්ම සිරියාව, නේපාලය, කසකස්තානය හා අසර්බයිජානය යන රටවල නේවාසික නියෝජිත ධුරයන්ද මෙහිදී ඇතුලත්ය. ඇය බුරුන්ඩි හා හයිටි රට වල මානුෂීය වැඩසටහන් මෙහෙයවා ඇති අතර ඇෆ්ගනිස්ථානය, කුවේට් ඇතුළු ප්‍රදේශ වල අන්තර් දේශසීමා මානුෂීය මෙහෙයුම් මෙහෙයවීමට දායකත්වය ලබා දී ඇත. ඇයට දශක තුනකට ආසන්න එක්සත් ජාතීන්ගේ අත්දැකීම් ඇත.

ඊජිප්තු ජාතිකයෙකු වන සිංගර් මෙනවිය, දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ඊජිප්තුවේ කයිරෝවේ ඇමරිකානු සරසවියෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද ලබා ඇත.

**අවසන්**

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ රාමු (UNSDF) 2018 - 2022 උපාය මාර්ගික මඟපෙන්වීම හා “එක්ව වැඩකිරීම” යටතේ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන් ශ්‍රී ලංකා රජයට සහය වන අතර සාමකාමී, සාධාරණ, අන්තර්කරණයවූ හා සමානාත්මතාව සහිත සංවර්ධනයක් ඇති කිරීම සඳහා කිසිවෙකු අත නොහැරීමට විශේෂ අවධානයක් යොමුකරමින් වඩා ඈතින්ම සිටින්නන්ට ප්‍රමුඛතාවයක් දීමට කටයුතු කරයි.